**පාතදුම්බර ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන.**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 05 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය.**

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම.**

-------------------------------------------

**1.3.1 නොසැසඳු පාලන ගිණුම්**

----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට රු.483,572 ක් වු පොදු ගබඩා පාලන ගිණුම් අනුව ශේෂය උපලේඛන අනුව, රු.456,602 ක් වුයෙන්, රු.26,970 ක නොසැසදීමක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට හිග හිටි ජල ගාස්තු පාලන ගිණුම අනුව රු.298,016 ක් වූ ශේෂය උපලේඛනය අනුව, රු.407,320 ක් වුයෙන්, රු.109,304 ක නොසැසදීමක් විය.

**1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

------------------------------------

(අ) ලැබියයුතු ගිණුම්

--------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.32,177,598 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලය ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.411,097 ක් විය.

(ආ) ගෙවියයුතු ගිණුම්.

---------------------

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලය ඉක්මවා තිබුණු ගෙවියයුතු ගිණුම් ශේෂ 04 ක එකතු වටිනාකම රු.750,294 ක් විය.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, වටිනාකම රු.892,664 ක් වූ විවිධ තැන්පතු විගණනයේ දී, සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,881,271 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,530,468 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.6,350,803 ක වර්ධනයක් දක්නට ලැබුණි.

## 2.2 විශ්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය හා සමග සැසඳීමේ දී, රු.24,255,273 ක වැඩි වීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2013 වර්ෂයේ දි, ආදායම් විෂයයන් 06 ක සියයට 07 සිට සියයට 60 දක්වා වූ වැඩිවීම සහ වියදම් විෂයයන් 04 ක සියයට 26 සිට සියයට 87 දක්වා වූ වියදම් අඩුවීම හේතුවී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.15,605,244 ක් ලැබී තිබුණු නමුත්, වැටුප් හා දීමනා ලෙස රු.19,366,815 ක් ගෙවා තිබුණි. ඒ අනුව, සභාවේ ආදායමෙන් රු.3,761,571 ක මුදලක් සභා සේවකයින්ගේ වැටුප් ගෙවීමට වැය කර තිබූ එම මුදල් සභාවේ පුනරාවර්ථන ආදායමෙන් සියයට 13 ක් වන බව නිරීක්ෂණය විය.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

**---------------------------------------**

**මුලු ජංගම වත්කම් සමග ජංගම වගකීම් අතර අනුපාතය 1.69:1 වූ අතර, පසු ගිය වර්ෂයේ අනුපාතය වූ 1.05:1 ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව නිරීක්ෂණය වූයෙන්, සමස්ත ජංගම වත්කම්වලින් සියයට 59 ක් හෙවත්, මිලියන 34 ක් කර්මාන්ත හා විවිධ ණයගැතියන් වූ අතර, මුලු ජංගම වගකීම්වලින් සියයට 70 ක් හෙවත්, මිලියන 24 ක කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.**

**2.4 ආදායම් පරිපාලනය**

**----------------------**

**2.4.1 කඩ කුළී**

**----------**

**සමාලෝචිත වර්ෂය අවසානයට හිග කඩ කුළී ආදායම රු.427,292 ක් විය. මඩවල වෙළඳ සංකීර්ණයේ අංක 10 දරන කඩ කාමරයේ රු.33,000 ක හිග කුළිය වසර 04 ක පමණ කාලයක් අය වී නොතිබුණි.**

**2.4.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.119,167 ක් හා මුද්දර ගාස්තු රු.1,418,480 ක් ලැබිය යුතුව තිබුණි.**

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** **සභාවේ නඩු 24 ක් සඳහා විගණන දින වූ 2014 ජනවාරි 31 දින වන විට රු.867,300 ක මුදලක් සභා අරමුදලින් දරා තිබුණි. මෙම නඩුවලින් 13 ක් වසර 05 කටත් වඩා කාලයක සිට සමථයකට පත්ව නොතිබුණි.**

**(ආ)** **2007 වර්ෂයේ විශ්‍රාම ගන්වනු ලැබූ නිලධාරීගෙන් අය වියයුතු රු.33,886 ක් වූ සේවක ණය මුදල විගණන දිනය වූ 2014 අගෝස්තු 18 දක්වා අය කර ගෙන නොතිබුණි.**

**3.2** **නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්.**

**මඩවල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 05 ක් 2011 වර්ෂයේ සිට වසා දමා තිබූ අතර**

**රු.600,000 ක් වටිනා ට්‍රැක්ටරයක් හා ට්‍රේලරය 2012 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.**

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** **සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර**

ආදායම් විෂයයන් 05 ක සියයට 12 සිට සියයට 46 දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 17 සිට සියයට 73 දක්වා ද විචලනයන් වු බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

(ආ) ආදායම් ශීර්ෂ 02 කට අයත් උප විෂයයන් 03 ක් සඳහා අයවැයගත කළ රු.155,500 ක් වු ආදායම් අයවීම් ප්‍රතිශතය සියයට 0 ක් විය.

**5.** පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය.